ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No .
දිනය / திகதி / Date. } 2025.08.28

ඩී. ශ්‍රියාලතා කුලසේකර
නො:76, උල්කන්ද,
හඳපානාගල, වැල්ලවාය.

**පැමිණිලිකාර පාර්ශවය**

1. කේ.එච්. සුමිත් පාලිත
පොලිස් පරීක්ෂක
පොලිස් ස්ථානය, වැල්ලවාය.

2. ඩබ්.ජේ.එස් වීරසිංහ
උප පොලිස් පරීක්ෂක
පොලිස් ස්ථානය, වැල්ලවාය

3. ටී.එම්. කරුණාතිලක
ප්‍රධාන පොලිස් පරීක්ෂක
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, වැල්ලවාය.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/HO/3322/24 -C**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම.**

පැමිණිලිකාරිය විසින් 2024.08.13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ පැමිණිල්ල ඉදිරිපත් කරමින් තමා එම්.ඩී. විජේරත්න යන අයගේ බිරිඳ වශයෙන් පවුල් ජිවිතයක් ගත කරමින් වසර 5ක කාලයක් ඔහු සමඟ ඔහුගේ නිවසේ ජීවත්ව සිටි බවත්, එහෙත් තමා එම්.ඩී. විජේරත්න සමඟ නීත්‍යානුකූලව විවාහ වී නොසිටි බවත්, ඒ අතර 2024.02.18 වන දින එම්.ඩී. විජේරත්න මිය ගිය බවත්, ඔහුගේ මෘත දේහය ඔහුගේ විවාහක බිරිඳට භාරදුන් බවත් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman } 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary } 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

එසේම, එම්.ඩී. විජේරත්න සහ තමා ජීවත් වුණු ඉඩම සහ නිවස එම්.ඩී. විජේරත්නගේ සොයුරියගේ පුත්‍රයා වන ජී.එච්. සරත් බන්දුල විජේවීර යන අයගේ නමට ලියා ඇති බවත්, එම්.ඩී. විජේරත්න මියගිය පසු වැල්ලවාය පොලිස් ස්ථානයේ සේවය කරන පොලිස් පරීක්ෂක පාලිත මයා විසින් තමා එම නිවසින් පන්නා එම්.ඩී. විජේරත්න යන අයගේ බිරිඳ වූ ආර්.ඩී. හුදු යන අයට නිවස භාර දුන් බවත්, එම නිවසේ තිබූ තමාගේ බඩුවලට අදාළව එකී භාණ්ඩ තමා විසින් සොරකම් කළ බවට වැල්ලවාය පොලිස් ස්ථානය වෙත එම්.ඩී. විජේරත්න යන අයගේ දියණිය විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අදාළව 2024.02.27 වන දින ප.ව. 6.00ට පමණ වැල්ලවාය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් තමා අත්අඩංගුවට ගෙන ඊට පසුදින එනම්, 2024.02.28 වන දින වැල්ලවාය දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවත්, අධිකරණයෙන් එදිනම ඇප ලබා දුන් බවත් පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල මගින් දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම.</u>

<u>1 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක කේ.එච්. සුමිත් පාලිත යන අයගේ කරුණු දැක්වීම.</u>

1 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක කේ.එච්. සුමිත් පාලිත යන අය විසින් 2025.01.10 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදී ඇත. එහිදී ඔහු මුල් අවස්ථාවේදී වැල්ලවාය පොලිස් ස්ථානයේ පැමිණිලි අංශයේ කටයුතු කළ බවත්, මේ වනවිට අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන බවත් සඳහන් කර ඇත. 2024.02.26 වන දින පැය 13.15ට වැල්ලවාය පොලිස් ස්ථානය වෙත මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා (එම්.ඩී. විජේරත්න යන අයගේ දියණිය) විසින් තම පියාගේ නිවසේ තිබූ භාණ්ඩ කිහිපයක් සොරකම් කරගෙන ඇති බවට පැමිණිල්ලක් සිදුකර තිබූ බවත්, එකී පැමිණිල්ල ප්‍රකාරව මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය තෙල්දෙණිය ප්‍රදේශයේ පදිංචිව සිටින බවත්, ඇයගේ මව ජීවත්ව සිටින බවත්, ඇයගේ පියා වන එම්. ඩී. විජේරත්න යන අය මියගොස් දැනට දින 09ක් වන බවත්, පියා මියයාමට අවුරුදු 2 ½කට පෙර වෙනත් කාන්තාවක් සමඟ පියාගේ නිවසේ පදිංචි වී සිටි බවත්, 2024.02.18 වන දින පියා මියයාමත් සමඟ පියාගේ අවසන් කටයුතු කිරීම සම්බන්ධයෙන් තම මව සහ මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන ශ්‍රියාලතා කුලසේකර යන අය අතර ආරවුලක් ඇතිවී තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක්ද සිදු කර තිබූ බවත්, දෙපාර්ශවයේ එකඟතාවය මත ශ්‍රියාලතා කුලසේකර යන අය මරණයේ වැඩකටයුතු සඳහා පිටතින් රැගෙන විත් තිබූ දේපළ නැවත රැගෙන යාමට එකඟවී තිබූ බවත්, එම දේපළ රැගෙන යන අවස්ථාවේදී පැමිණිලිකාරිය හා පවුලේ උදවිය භාවිත කළ උපකරණ ද රැගෙන ගොස් තිබූ බවත් සඳහන් කර තිබුණි.

1 වන වගඋත්තරකරු විසින් ඉහත කී පැමිණිල්ලට අදාළව විමර්ශන කටයුතු සිදු කළ බවත්, එහිදී ශ්‍රියාලතා කුලසේකර, ආභරණ දේවයලාගේ රණවීර සහ ගම්හේවයලාගේ ගයානි කෝසලා යන අය එකී පැමිණිල්ලේ සඳහන් භාණ්ඩ රැගෙන ගොස් ඇති බව අනාවරණය වූ බවත්, ඒ අනුව ඔවුන්

තිදෙනා හට 2024.02.27 වන දින සවස 5.00ට පමණ පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට නිලධාරියෙකු මගින් දැනුම්දුන් බවත්, ඔවුන් සවස 5.00ට පැමිණි පසුව මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර සොරකමට සැකපිට අත්අඩංගුවට ගත් බවත්, ඔවුන් තිදෙනාගේ ප්‍රකාශ තමා විසින් සටහන් කළ බවත්, එහිදී ආභරණ දේවයලාගේ රණවීර යන අය විසින් එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසේ තිබූ භාණ්ඩ වලට අමතරව කැත්තක්ද රැගෙන ගිය බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව සැකකරුගේ නිවසේ තිබී එම කැත්ත සොයාගත් බවත්, 2024.02.28 වන දින මෙම සැකකරුවන් තිදෙනා අධිකරණයට ඉදිරිපත් කළ බවත්, අදාළ කැත්ත ද නඩු බඩු දේපළ කුවිතාන්සි අංක 326 යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර ඇත.

1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමා හට කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන ශ්‍රියාලතා කුලසේකර යන අය සමඟ කිසිඳු පුද්ගලික අමනාපයක් නොමැති බවත්, තමා විසින් අදාළ අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ දේපළ සොරකමට අදාළව අනාවරණය වූ තොරතුරු මත බවත්, එය ඉතා සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් වන බවත්, එම සොරකම සම්බන්ධයෙන් අදාළ පුද්ගලයින් තිදෙනා අත්අඩංගුවට නොගත්තේ නම් එම ප්‍රදේශයේ විශාල මහජන කැළඹීමක් ඇතිවිය හැකිව තිබූ බවත්, ශ්‍රියාලතා කුලසේකර යන අය මරණයට පත්වීමට පවා හැකියාවක් තිබූ බවත් ය.

<u>2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එස්. වීරසිංහ යන අයගේ කරුණු දැක්වීම</u>

2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එස්. වීරසිංහ යන අය විසින් 2025.01.10 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින් තමා 2024.02.18 වන දින වැල්ලවාය පොලිස් ස්ථානයට අනුයුක්තව පාලන අංශයේ ස්ථානාධිපති ලෙස රාජකාරියේ යෙදී සිටි බවත්, උල්කන්ද, හඳපානාගල ප්‍රදේශයේ පදිංචි එම්.ඩී. විජේරත්න යන අය හෘදයාබාධයකින් වැල්ලවාය රෝහලේදී මියගිය පසු මියගිය අයගේ නීත්‍යානුකූල බිරිඳ ඇතුළු පාර්ශවය හා මියගිය අයගේ නීත්‍යානුකූල නොවන බිරිඳ අතර මෘත ශරීරය සම්බන්ධයෙන් අයිතිය ඉල්ලා ආරාවුලක් පැනනැගීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට දෙපාර්ශවය පොලිස් ස්ථානයට පැමිණ සිටි බවත්, පැමිණිලි අංශයේ ස්ථානාධිපති මෙදින අධිකරණ කටයුත්තකට පොලිස් ස්ථානයෙන් බැහැරවී සිටි බැවින් පැමිණිලි අංශයේ වැඩබලන ස්ථානාධිපති ලෙස එම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙසට ස්ථානාධිපතිතුමා විසින් උපදෙස් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

එසේම එකී පැමිණිල්ල විමර්ශනය කිරීමේදී මියගිය එම්.ඩී. විජේරත්න යන අයගේ මෘතදේහය පිළිබඳ අවසන් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ සහ අනියම් බිරිඳ අතර ආරාවුලක් පවතින බව අනාවරණය වූ බවත්, ඔවුන් ආවේගශීලීව වචන හුවමාරු කර ගනිමින් තමා ඉදිරියේ හැසිරුණු බවත්, ඒ අනුව තමා විසින් දෙපාර්ශවය අතර නීතය හා සාමය ඇතිවන ආකාරයට අවශ්‍ය රාජකාරි කටයුතු සිදු කළ බවත්, මියගිය අයගේ මෘතදේහය නීතියට අනුව නීත්‍යානුකූල බිරිඳ හා දරුවන්ට අවසන් කටයුතු කිරීම සඳහා අයිතිය පැවරෙන බැවින් නීත්‍යානුකූල නොවන බිරිඳටද ඔවුන්

හා එක්වී අවසන් කටයුතු සිදු කිරීමට සම්බන්ධ වීමට බාධාවක් නොවන බව පැහැදිලි කරදුන් බවත්, මියගිය අයගේ දේපළ හා ඉඩකඩම් වල අයිතිය සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමා හමුවී පැමිණිල්ලක් සිදුකර එම අයිතීන් පිළිබඳ තහවුරු කර ගැනීමට කටයුතු කරන ලෙස දෙපාර්ශවයට තමා විසින් වැඩිදුරටත් දැනුම්දුන් බවත්, ඉන්පසුව දෙපාර්ශවය විසින් තමා ලබාදුන් උපදෙස් හා කරුණු කාරණා අනුව කටයුතු කරන බවටත් ඔවුන් අතර කිසිඳු ආරාවුලක් නොමැති බවටත් පවසා පොලිස් ස්ථානයෙන් පිටවූ බවත්, දෙවන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, මෙම පැමිණිලිකාරිය විසින් පවසා ඇති පරිදි ඉහත කී විමර්ශනයේදී තමා විසින් සෙරෙප්පුව පොළොවේ ගසා ඇය හට "තමුන් රෝහලට යනවා" යනුවෙන් නොපැවසූ බවත්, එකී චෝදනාව තමා විසින් ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකාරිය විසින් පවසා සිටින පරිදි 2024.02.26 වන දින උල්කන්ද පිහිටි එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසට ගොස් කිසිඳු විමර්ශන කටයුත්තක් තමා විසින් සිදු නොකළ බවත්, සියලු විමර්ශන පොලිස් පරීක්ෂක පාලිත මහතා විසින් සිදු කර ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>3 වන වගඋත්තරකාර වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව 3 වන වගඋත්තරකාර වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අංක 3447/24 සහ 2024.09.23 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් 2024.02.18 වන දින උල්කන්ද, පුබුදුවැව ගම, හදපානගල ලිපිනයේ පදිංචිව සිටි මුතුවා දූරයලාගේ විජේරත්න යන අය හදිසියේ ඇති වූ අසනීප තත්ත්වයක් හේතුවෙන් වැල්ලවාය රෝහලේදී මිය ගොස් ඇති බවට වාර්තා වී ඇති බවත්, මෙම මෘත ශරීරය භාරගැනීම සඳහා 2024.02.19 වන දින මරණකරුගේ නීත්‍යානුකූල බිරිඳ සහ දරුවන් ඉදිරිපත් වීමේදී මරණකරු මිය යාමට පෙර නිවසට කැඳවා ගෙන එන ලද අනියම් බිරිඳ වන දෝන ශ්‍රියාලතා කුලසේකර යන අය සමඟ ආරවුලක් ඇති වී එම අවස්ථාවේදී මරණ පරීක්ෂණය සිදු කිරීමක් නොකර දෙපාර්ශවය පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

දෙපාර්ශවය පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසුව උ.පො.ප සරත් නිලධාරියා විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිල්ල විභාග කර ඇති අතර, එම අවස්ථාවේදී අනාවරණය වී ඇත්තේ මරණකරු නීත්‍යානුකූලව විවාහ වී සිටි 'රාජමුණි දේවයලාගේ හුදු යන අය සිටියදීම අනියම් කාන්තාවක් නිවසට රැගෙන ඒම හේතුවෙන් දෙදෙනා වෙන්ව ජීවත් වී ඇති බවත්, මරණකරු ජීවත්ව සිටි කාලයේ ඔහුගේ දරුවන් තම පියාට අඩුපාඩුවක් නොමැතිව සලකා ඇති බවත් ය. මරණකරු ජීවත්ව සිටි කාලයේ නිවසට කැඳවාගෙන එන ලද අනියම් කාන්තාව ද මෙම මෘත ශරීරය ඉල්ලා සිටියත් දෙපාර්ශවයට කරුණු පහදා දීමෙන් පසුව දෙපාර්ශවයේ එකඟතාව මත නීත්‍යානුකූල බිරිඳ වන රාජමුණි දේවයලාගේ හුදු යන අය මෘත ශරීරය භාර ගැනීමට කටයුතු කර ඇති බවත් වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

මේ අවස්ථාව වන විට මරණකරු පදිංචිව සිටි නිවසේ අවසන් කටයුතු කිරීම සඳහා මරණකරුගේ අනියම් බිරිඳ වන දෝන ශ්‍රියාලතා කුලසේකර සහ මරණකරුගේ සහෝදරියගේ දියණිය වන ගම්හේවයලාගේ ගයානි කෝසලා සහ ඇයගේ ස්වාමි පුරුෂයා වන ආහරණ දේවයලාගේ රණවීර යන අයවලුන් මරණකරු පදිංචිව සිටි නිවසේ මඩු සකස් කර වෙනත් ස්ථානවලින් භාණ්ඩ රැගෙන විත් අවසන් කටයුතු කිරීමට කටයුතු කර ඇත. මරණකරුගේ නිත්‍යානුකූල බිරිඳ සහ ඇයගේ දරුවන් නිවසට ගෙනවිත් ඇති මඩු සහ වෙනත් දේපළ රැගෙන යන ලෙසටත් ඉල්ලා ඇත. දෙපාර්ශවයේ එකඟතාවය මත එම දේපල ඉවත් කිරීමට අනෙක් පාර්ශවය කැමැත්ත පල කර ඇත. එම කරුණු අනුව උ. පො. ප සරත් නිලධාරියා විසින් මෙම දෙපාර්ශවයට ආරවුල් ඇති නොකර සිටීමටත්, දේපල සම්බන්ධයෙන් ආරවුලක් ඇති වන්නේ නම් මරණ කටයුතුවලින් පසුව විසඳා ගැනිමට කටයුතු කරන ලෙසටත්, උපදෙස් ලබා දී ඇත.

2024.02.19 වන දින මරණකරුගේ නීත්‍යානුකූල බිරිඳ සහ දරුවන් රෝහලේ සිටියදී දෝන ශ්‍රියාලතා කුලසේකර, ආහරණ දේවයලාගේ රණවීර සහ ගම්හේවයලාගේ ගයානි කෝසලා යන අය මරණකරු පදිංචිව සිටි නිවසට ගොස් එම නිවසේ තිබු මරණකරු සතු දේපල ද මරණ කටයුතු සඳහා රැගෙන එන ලද දේපල ද රැගෙන ගොස් ඇති බවට 2024.02.26 වන දින උල්කන්ද, හඳපානගල ලිපිනයේ පදිංචි මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා නැමති අය විසින් (මියගිය අයගේ නීත්‍යානුකූල විවාහයේ දියණිය) පොලිස් ස්ථානයට පැමිණ තම පියාගේ මරණ කටයුතු සිදු කරන අවස්ථාවේදී පියා ජීවත්ව සිටි නිවසේ එදිනෙදා භාවිතා කරන ලද භාණ්ඩ කීපයක්ද රැගෙන ගොස් ඇති බවත්, මෙම දේපල ලබා ගැනිමට කටයුතු කර දෙන මෙන් ඉල්ලා පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිස් පරික්ෂක පාලිත ඇතුළු නිලධාරින් විසින් විමර්ශනයක් සිදු කර දේපල සම්බන්ධයෙන් වූ ආරවුල විසඳීම සඳහා කටයුතු කිරීමේදි මරණකරුගේ දේපල මරණකරුගේ ඥාතින් නිවසේ නොමැති අවස්ථාවකදි රැගෙන ගොස් ඇති බවට අනාවරණය කර ගැනීමෙන් පසු 2024.02.27 වන දින ඒ සඳහා සැකකරුවන් වන 01. අහරණ දේවයලාගේ රණවීර- අංක 104, උල්කන්ද, හඳපානාගල 02. ගම්හේවයලාගේ ගයානි කෝසලා- අංක 104, උල්කන්ද, හඳපානාගල 03. දෝන ශ්‍රියාලතා කුලසේකර- අංක 487/02, ගෝනහේන, කඩවත, යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. තවද මරණකරුගේ නිවසේ තිබු දේපලවලින් කැත්තක් අහරණ දේවයලාගේ රණවීර යන අයගේ නිවසේ තිබියදී සොයාගෙන පොලිස් ස්ථානයට ගෙන විත් නඩු බඩු දේපල කුවිතාන්සි අංක 326/24ට ඇතුලත් කර ඉදිරිපත් කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් 2024.02.28 වන දින වැල්ලවාය ගරු අධිකරණයට නඩු අංක 67585 යටතේ කරුණු වාර්තා කරමින් දණ්ඩ නීති සංග්‍රහයේ 434 සහ 369 යන වගන්ති යටතේ සැකකරුවන් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවත්, එදින මෙම සැකකරුවන්ට රුපියල් ලක්ෂ දෙක බැගින් ශරීර ඇප නියම කර 2024.07.02 වන දිනට වැඩිදුර වාර්තා සඳහා දින ලබා දී ඇත.

ඒ අනුව, පොලිස් පරික්ෂක පාලිත නිලධාරියා විසින් විමර්ශනයන් සිදු කර එම සැකකරුවන් අත් අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත්, මෙම සිද්ධියට අදාළව මොනම අවස්ථාවකදීවත් පොලිස් නිලධාරින් විසින් දෝන ශ්‍රියාලතා කුලසේකර නැමති අය ඉඩමින් හෝ නිවසින් නෙරපීමට කටයුතු කර නැති බවත්, ප්‍රියංගිකා යන අයගෙන් අසත්‍ය පැමිණිල්ලක් සටහන් කිරීමට කටයුතු කර නැති බවත්, දෝන ශ්‍රියාලතා කුලසේකර නැමති අය අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැය 31ක කාලයක් ස්ථානයේ රඳවා ගැනිමට කටයුතු කර නැති බවත්, අනෙක් සැකකරුවන් හා සමානව කටයුතු කර ඇති බවත්, ඇයගේ රුපියල් ලක්ෂ 10ක් වටිනා දේපල පො.ප. පාලිත නිලධාරියා භුක්ති විඳීමට කටයුතු කර නැති බවත්, මෙම තැනැත්තිය මීට පෙරත් මේ අකාරයට උසස් නිලධාරින් වෙත කරන ලද පැමිණිලිවලදි මෙවැන්නක් නොකියා ඇති බැවින් අසත්‍ය කරුණු ප්‍රකාශ කර ඇති බවත් වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ වාර්තාවට අදාළ පැමිණිලිකාර පාර්ශවයේ විරෝධතා.</u>

ඩී. ශ්‍රියාලතා කුලසේකර වන තමා 2019 සිට එම්. ඩී විජේරත්න යන අය සමඟ ඔහුගේ බිරිඳ ලෙස මරණය තෙක් අවුරුදු පහක් එකට ජීවත් වූ බවත්, ඊට පෙර ඔහු විවාහ වී සිටි බිරිඳ වන ආර්. ඩී. හුදු යන අය ඔහුගෙන් වෙන්වී ඇත්තේ 2000 වර්ෂයේ දී බවත්, මරණකරු වන තමාගේ සැමියා තමා සමඟ පැමිණියේ මේ සියලු තොරතුරු තමාහට පවසමින් බවත්, ඔහුගේ පළමු බිරිඳ තමා එනවිට ළමයි සමඟ වෙනම ජීවත් වූ බවත්, ඔවුන් කිසිවකු ඔහුට උදවු උපකාර කර නැති බවත්, ඒ සම්බන්ධයෙන් ඔහු බොහෝ සිත්තැවුලෙන් සිටි බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

එසේම, එම්. ඩී විජේරත්න යන අයගේ බිරිඳ නිතර ඔහු සමඟ රණ්ඩු සරුවල් වී ඇති බවත්, බිරිඳගෙන් සහ ඔහුගේ ළමයින්ගෙන් කිසිම උදව්වක් ලැබී නොමැති බවත්, තමා මෙහි පැමිණි දිනයේ නිවස අවට කැලේ වැවී නිවස පාලුවට ගොස් තිබු බවත්, තමා පැමිණ මෙම නිවස හා ඉඩම එළිපෙහෙළි කර ගත් බවත්, එලෙස සිටින අතරතුර 2024.02.18 වන දින හදිසියේ එම්. ඩී විජේරත්න යන අය රෝගාතුර වූ නිසා එදින පාන්දරින් තමා විසින් වැල්ලවාය රෝහලට ඔහු ඇතුලත් කළ බවත්, ඔහු එදින ප.ව. 1.10 ට පමණ මිය ගිය බවත්, මෙම මරණය දැනගත් ඔහුගේ බිරිඳ සහ ළමයින් පැමිණ වැල්ලවාය පොලිස් ස්ථානය වෙත ගොස් මෘත දේහය ඉල්ලා සිටි බවත් පැමිණිලිකාරිය විසින් දක්වා ඇත.

තවද, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වැල්ලවාය පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව මගින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්, පොලිස් නිලධාරීන් විසින් තමා නිවසින් පන්නා දැමු බවත්, ඔවුන් තමාහට අයිති භාණ්ඩ වන අල්මාරිය සහ ඇඳුම් සියල්ල එම්. ඩී විජේරත්න යන අයගේ බිරිඳ හා දරුවන් හට අයිති බව පවසා තමාහට නිවසින් පිටවන ලෙස පැවසු බවත්, වැල්ලවාය පොලිස් ස්ථානය මගින් මෙම පැමිණිල්ල විභාගකර බොරු සාක්ෂි ඉදිරිපත්කර ඇති අතර, සත්‍ය වසන්කර වාර්තාව ලියා ඇති බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

2024.02.27 වන දින තමාට, එම්. ඩී විජේරත්න යන අයගේ සහෝදරියගේ දූවට සහ ඇයගේ සැමියා හට වැල්ලවාය පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දන්වා තිබූ බැවින් එදින උදෑසන 9.00ට පොලිස් ස්ථානයට ගිය පසු එම්. ඩී විජේරත්න යන අයගේ නිවසේ තිබූ භාණ්ඩ හොරකම් කරගෙන ගිය බවට ප්‍රකාශ කරමින් දොස් පැවරූ බවත්, පොලිස් නිලධාරීන් විසින් එම්. ඩී විජේරත්න යන අයගේ සහෝදරියගේ දූවගේ නිවසට පැමිණ එහි තිබූ කැත්තක් රැගෙන ගොස් තිබූ බවත්, එය එම්. ඩී විජේරත්න යන අයගේ නිවසින් සොරාගත් කැත්තක් බවට පොලිස් නිලධාරීන් විසින් ප්‍රකාශ කළ බවත්, 2024.02.27 වන දින උදෑසන 9.00 සිට සවස 6.30 වෙනතුරු පොලිස් නිලධාරීන් විසින් තමාගෙන් ප්‍රශ්න කළ බවත්, එම්. ඩී. විජේරත්න යන අයගේ සහෝදරියගේ දූවගේ සැමියා සිර මැදිරියට දමා පසු දින උදේ 7.30 පමණ වෙනතුරු සිර මැදිරියේ රඳවා තැබූ බවත්, තමා සහ එම්. ඩී විජේරත්න යන අයගේ සහෝදරියගේ දූව පොලිස් ස්ථානයේ තිබූ බැංකුවක වාඩි කර තැබූ බවත්, අත්අඩංගුවට ගත් දිනට පසු දින එනම්, 2024.02.27 වන දින උදෑසන 11.00ට පමණ වැල්ලවාය දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇප ලබා දුන් බවත්, පොලිස් නිලධාරීන් විසින් ඔවුන් පවසන කිසිම දෙයක් පිළිනොගත් බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

<u>**නිරීක්ෂණ**</u>

පැමිණිලිකාර ඩී. ශ්‍රියාලතා කුලසේකර යන අය 2019 වර්ෂයේ සිට එම්.ඩී. විජේරත්න යන අය සමඟ අඹු සැමියන් ලෙස එම්.ඩී. විජේරත්න යන අයට අයත් උල්කන්ද, පුබුදුවැව ගම, හඳපානාගල පිහිටි නිවසෙහි දිවිගෙවා ඇති බවත්, එහෙත් ඔවුන් දෙදෙනා නීත්‍යානුකූලව විවාහ වී සිට නොමැති බවත්, එම්.ඩී. විජේරත්න යන අය, ආර්.ඩී. හුදු නම් කාන්තාවක සමඟ විවාහ වී සිට ඇති බවත්, එකී විවාහයෙන් ඔහුහට දරුවන් සිට ඇති බවත්, එම විවාහයෙන් නීත්‍යානුකූලව වෙන් වී නොමැති බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් පැමිණිලිකාරිය, එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසට පැමිණෙන විට ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ හෝ දරුවන් ඔහු සමඟ එම නිවසෙහි ජීවත්ව සිට නොමැති බවත්, එලෙස සිටින අතරතුර 2024.02.18 වන දින එම්.ඩී. විජේරත්න යන අය රෝගාතුර වූ නිසා එදින පාන්දර පැමිණිලිකාරිය විසින් ඔහුව වැල්ලවාය රෝහලට ඇතුලත් කර ඇති බවත්, ඔහු එදින ප.ව. 1.10 ට පමණ මිය ගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

එම්.ඩී. විජේරත්න යන අයගේ මරණය පිළිබඳව දැනගැනීමෙන් පසුව ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ වන ආර්.ඩී. හුදු යන අය විසින් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත ගොස් පැමිණිල්ලක් සිදු කරමින් සිය ස්වාමි පුරුෂයාගේ මෘත දේහය වැල්ලවාය රෝහලේ තිබෙන බවත්, ඇය හට එම මෘත දේහය සිය නිවස වෙත ගෙනගොස් අවසන් කටයුතු සිදු කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිට ඇති බවත්, එකී පැමිණිල්ල වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් (2) පොතේ 2024.02.19 වන දින පැය 15.00ට පිටුව 341 සහ ඡේදය 191 යටතේ සටහන් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එකී පැමිණිල්ලට අදාළව එම්.ඩී. විජේරත්න යන අයගේ නීත්‍යානුකූල බිරිඳ වන ආර්.ඩී. හුදූ යන අය සහ නීත්‍යානුකූල නොවන බිරිඳ වන ඩී. ශ්‍රියාලතා කුලසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) යන අය 2024.02.19 වන දින වැල්ලවාය පොලිස් ස්ථානය වෙත කැඳවා 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එස්. වීරසිංහ නිලධාරියා විසින් විමර්ශනයක් සිදු කර එම්.ඩී. විජේරත්න යන අයගේ මෘත දේහය නීත්‍යානුකූල බිරිඳ වන ආර්.ඩී. හුදූ යන අය වෙත භාරදීමට කටයුතු කර ඇති බවත් පෙනී යයි.

අනතුරුව 2024.02.26 වන දින පැය 13.15ට උල්කන්ද, හඳපානාගල පදිංචි මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් ඇයගේ පියා වන මියගිය එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසේ තිබූ භාණ්ඩ ගණනාවක් ඔහු සමඟ එකී නිවසෙහි දිවි ගෙවූ ඔහුගේ අනියම් බිරිඳ වන ඩී. ශ්‍රියාලතා කුලසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) විසින් එම්.ඩී. විජේරත්න යන අයගේ සහෝදරියගේ දියණිය වන ගයානි කෝසලා යන අයගේ නිවස වෙත රැගෙන ගොස් ඇති බවට වැල්ලවාය පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇති බවත්, එකී පැමිණිල්ල වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් i පොතේ පිටුව 240 සහ ඡේදය 199 යටතේ සටහන් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසේ තිබූ කලුපාට කැසට් යන්ත්‍රයක්, බෆල් එකක්, අබාන්ස් අඟල් 24 ටී.වී. එකක්, රයිස්කුකර් එකක්, හීටර් ජෝගු එකක්, ටී.වී. ස්ටෑන්ඩ් එකක්, කුලු ගෙඩියක්, මිටිය, කැත්ත, තවත් පිහි 04ක්, භූමිතෙල් මෝටරයක්, විදුලි මෝටරයක්, පුට් වැල් බට 02ක් හා ඊට අමතර අඟල් 02 වතුර බට අඩි 150ක් දිග බට රෝල් 02යි, අබාන්ස් දොර දෙකේ ශීතකරණයක්, ප්ලාස්ටික් පුටු 06ක්, අඩි 1-1/2 පලල අඩි 03ක යකඩ පෙට්ටියක්, ලොකු දොදොල් තාච්චිය, ලොකු මුට්ටිය, යකඩ ඇඳක්, පියාගේ බැංකු පොත් 3ක්, ඉඩමේ ඔප්පුව, පවුලේ ආරවුල් සම්බන්ධ නඩු තීන්දුව, තඹ කළයක්, තඹ කොරහක්, තඹ ඉලත් තට්ටුවක්, පොරව, යකඩ ඉන්න යන බඩු ගණනාවක් ගයානි කෝසලා යන අයගේ නිවස වෙත රැගෙන ගොස් ඇති බවත්, එම භාණ්ඩ එම්.ඩී. විජේරත්න යන අය ජීවතුන් අතර සිටිය දී තමා විසින් ඔහු හට ගෙනවිත් දුන් භාණ්ඩ වන බවත් මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත ගොනු කර ඇති ඉහත කී පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇති බව පෙනී යයි.

එලෙස මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් සිදු කරන ලද පැමිණිල්ලට අදාළව ඩී. ශ්‍රියාලතා කුලසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) සහ ගම්හේවයලාගේ ගයානි කෝසලා යන අයවලුන් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත කැඳවා ඔවුන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව 2024.02.27 වන දින පැය 13.50ට වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් i පොතේ පිටුව 248 සහ ඡේදය 206 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව ගම්හේවයලාගේ ගයානි කෝසලා යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ "මට විරුද්ධව පැමිණිලි කරල තියෙන්නේ මගේ අම්මාගේ අයියාගේ දුව වන ප්‍රියංගිකා. මගේ අම්මගේ අයියා වන විජේ මාමාගේ දෙවන බිරිඳ වන ශ්‍රියානි යන අය අවුරුදු 04ක් විතර මාමා සමග පවුල් ජීවිතයක් ගත කළා. ඒ අතරතුර මගේ මාමා මියගියාට පසුව එම නැන්දා එම ගෙදර පළමු බිරිඳට භාර දුන්නා. ඊට පස්සේ නැන්දාට යන්න එන්න තැනක් නැති නිසා එම නැන්දාගේ රෙදි ටික විතරක් අරගෙන මගේ ගෙදරට ආවා. මෙයා කියන විදියට දේපළ කිසිවක් මගේ ගෙදරට ගෙන ආවේ නැහැ. මේ පැමිණිලිකාරිය කියන විදියට මේ දේපළ කිසිවක් නැහැ" යනුවෙනි.

එසේම, ඩී. ශ්‍රියාලතා කුලසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ "මම 2020 වර්ෂයේ උල්කන්ද ප්‍රදේශයේ එම්.ඩී. විජේරත්න සමග මගුල් යෝජනාවක් මගින් එයා සමග ආවා. ඒ ඇවිත් අපි දෙන්නා මේ වෙනකන් පවුල් කෑවා. නමුත් විවාහ වුනේ නම් නැහැ. එම්.ඩී. විජේරත්න හදිසි රෝගාබාධයක් නිසා රෝහලට ඇතුළත් කළා. එහිදී මියගියා. එයා මියගිය අවස්ථාවේ මිනිය භාර ගැනීමට එම අයගේ නීත්‍යානුකූල බිරිඳට භාර දුන්නා. එම නිවසේ තිබූ අවමංගල්‍ය කටයුතු සඳහා සකස් කළ මඩුව මම ගලවාගෙන මගේ රෙදි ටිකත් අරගෙන එම්.ඩී. විජේරත්න යන අයගේ නංගී වන එම්.ඩී. සුනිල් පද්මා යන අයගේ දුවගේ නිවසට ගියා. මේ වෙනකන් එහෙ තමයි හිටියේ. නමුත් මම එම්.ඩී. විජේරත්න සමඟ සිටි නිවසේ කිසිම දේපළක් අරගෙන ගියේ නැහැ" යනුවෙනි.

එකී ප්‍රකාශ අනුව එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසේ තිබූ කිසිදු දේපළක් ඔවුන් විසින් රැගෙන නොගිය බවට පොලිස් නිලධාරීන් වෙත ප්‍රකාශ කර ඇති බව පෙනී යයි. එසේම, ඉහත කී මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත සිදු කරන ලද පැමිණිල්ල ප්‍රකාරව අදාළ භාණ්ඩ ගයානි කෝසලා යන අයගේ නිවස වෙත රැගෙන ගොස් ඇති බවට ප්‍රකාශ කර තිබුණ ද එකී භාණ්ඩ එම නිවසෙහි තිබේද යන්න පොලිස් නිලධාරීන් විසින් පරීක්ෂාවකට ලක් කර ඇති බවට අනාවරණය නොවේ.

එසේ වුවද මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් සිදු කරන ලද පැමිණිල්ලට අදාළව 2024.02.27 වන දින පැය 18.10ට 01. අභරණ දේවයලාගේ රණවීර- අංක 104, උල්කන්ද, හදපානාගල 02. ගම්හේවයලාගේ ගයානි කෝසලා- අංක 104, උල්කන්ද, හදපානාගල 03. දෝන ශ්‍රියාලතා කුලසේකර- අංක 487/02, ගෝනහේන, කඩවත, යන අයවලුන් 1 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක කේ.එච්. සුමිත් පාලිත යන අය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් i පොතේ පිටුව 257 සහ ඡේදය 212 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

එලෙස අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ආභරණ දේවයලාගේ රණවීර යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, එහිදී ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ "මගේ බිරිඳගේ අම්මගේ අයියාගේ නම විජේරත්න. එයා මීට ටික දවසකට කලින් මියගියා. මියයන අවස්ථාව වනවිට එයා හිටියේ අනියම්

බිරිඳ සමගයි. ඒ අයගේ නම දන්නේ නැහැ. මාමාගේ මළ ගෙදර වැඩකටයුතු කරන්න මමයි මගේ බිරිඳයි බිරිඳගේ ඥාති පිරිසකුයි මගේ ලැන්ඩ්මාස්ටර් එකෙන් මළ ගෙදරට ඕන කරන පිඟන් කෝප්ප, ටෙන්ට් එකක් සහ තවත් දේපළ රැගෙන ගියා. අපි ඒවා අරගෙන ගියේ ඒ ගෙදර කවුරුත් නැති නිසා. මගේ බිරිඳට මැරුණු මාමාගේ බිරිඳ කෝල් එකක් දීල කීවා 'මගේ මිනිහගේ මරණ කටයුතු උඹල කරන්න ඕන නැහැ. අපි කර ගන්නම්. උඹලගෙ ගෙනාපු බඩුත් අරගෙන පලයල්ලා' කියලා. ඒ නිසා ඒ බඩු අපි නැවත පටවාගෙන ගියා. යන විට මළ ගෙදර තිබුණු කැත්තකුත් අරගෙන ගියා. කැත්ත කාමරයේ දොර මුල්ලේ ඇති. පෙන්නන්න පුළුවන්".

ඒ අනුව ආභරණ දේවයලාගේ රණවීර යන අය විසින් එම්.ඩී. විජේරත්න යන අයගේ නිවසින් රැගෙන ගිය බවට සඳහන් කර ඇති කැත්ත, පොලිස් නිලධාරීන් විසින් ආභරණ දේවයලාගේ රණවීර යන අයගේ නිවසට ඔහුව රැගෙන ගොස් පොලිස් නිලධාරීන්ගේ භාරයට ගෙන ඇති බව වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් (2) පොතේ 2024.02.28 වන දින පැය 12.40ට පිටුව 52 සහ ඡේදය 390 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

තවද, මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය විසින් වැල්ලවාය පොලිස් ස්ථානය වෙත සිදු කර ඇති ඉහත කී පැමිණිල්ලට අදාළව මුතුවා දූරයලාගේ නන්දාවතී යන අයගෙන් සාක්ෂියක් සටහන් කරගෙන ඇති බව වැල්ලවාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් (2) පොතේ 2024.02.28 වන දින පැය 12.40ට පිටුව 52 සහ ඡේදය 390 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එහිදී "2024.02.18 වන දින විජේරත්න අයියා මියගිය බව ආරංචි වුනා. එදින සවස දුව සමග මම විජේරත්න අයියලාගේ ගෙදර ආවා. ඒ අවස්ථාවේ රණවීර මහ ට්‍රැක්ටරයක් අරන් ආවා. විජේරත්න අයියලාගේ ගේ ඇතුලේ තිබුණ වී මිටි 06ක් ට්‍රැක්ටරයට පැටෙව්වා. ඒ අවස්ථාවේ දෝනි, ශ්‍රියානි, දෝනිගේ මහත්තයා අගල් දෙකේ බට බැඳල තිබුන රෝලක් පැටෙව්වා. කොච්චර දිගද කියල මම දන්නේ නැහැ. පොහොර බෑග් එකකට දමාගත් ටීවී එකකුත් ට්‍රැක්ටරයට දමා ගත්තා. කොච්චර තිබුනාද කියලා මම දන්නෙ නැහැ. මම ඒවා පටවන බව දැක්කා. මම බඩු ටික පටවන්න උදව් කළා. එම බඩු ටික අරගෙන දෝනි හා දෝනිගේ මහත්තයා රණවීර ගියා" යනුවෙන් ප්‍රකාශයක් ලබා දී ඇති බවත් පෙනී යයි. මෙම ප්‍රකාශය සටහන් කරගෙන ඇත්තේ අදාළ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව බව ද නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරුණු අනුව ඩී. ශ්‍රියාලතා කුලසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) යන අය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඇය විසින් මුතුවා දූරයලාගේ ප්‍රියංගිකා යන අය වැල්ලවාය පොලිස් ස්ථානය වෙත සිදු කර තිබූ පැමිණිල්ලෙහි සඳහන් භාණ්ඩ අතරින් කිසිදු භාණ්ඩයක් රැගෙන ගිය බවට කිසිදු තොරතුරක් අනාවරණය වී නොමැති බවත්, පොලිස් නිලධාරීන් විසින් ඇය සන්තකයේ තිබී කිසිදු භාණ්ඩයක් සොයාගෙන නොමැති බවත් නිරීක්ෂණය වේ. එම පැමිණිල්ලෙහි සඳහන් භාණ්ඩ අතරින් සොයා ගත් බවට අනාවරණය වී ඇත්තේ එම්.ඩී. විජේරත්න අයගේ නිවසේ තිබූ කැත්තක් පමණි. එයද රැගෙන

ගොස් ඇත්තේ පැමිණිලිකාරිය නොව ආභරණ දේවයලාගේ රණවීර යන අය බවට ඔහු විසින් පොලිස් නිලධාරීන් වෙත ප්‍රකාශ කර ඇති අතර, ඔහුගේ නිවසේ තිබී එය හමුවී ඇත.

එසේ වුවද 2024.02.28 වන දින නිවසට අයුතු ලෙස ඇතුළු වී නිවසේ තිබූ දේපළ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිලිකාරිය සහ ඉහත කී ආභරණ දේවයලාගේ රණවීර සහ ගම්හේවයලාගේ ගයානි කෝසලා යන අයවලුන් අංක බී 67585 යටතේ වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එහිදී ඔවුන් ඇප මත නිදහස් වී ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, 2024.07.02 වන දින වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අංක 67585 නඩුවට අදාළව වැල්ලවාය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය වෙත වැඩිදුරටත් කරුණු වාර්තා කර ඇති අතර, එහිදී මෙම සිද්ධිය සම්බන්ධව වැඩිදුරටත් විමර්ශනය කිරීමේදී ඉහත සඳහන් තිදෙනාට අදාළව අයුතු ඇතුළුවීමක් හෝ සොරකම් කිරීමේ චෝදනාවක් පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගතවී ඇති බවත්, ඒ අනුව මෙම සැකකරුවන් මුදාහැර නඩු කටයුතු අවසන් කිරීමට අවසර ලබාදෙන ලෙසත් ගරු අධිකරණයෙන් ඉල්ලා ඇත. එකී ඉල්ලීම පරිදි ඉහත කී තිදෙනා මුදාහැර අංක 67585 දරණ නඩුවේ නඩු කටයුතු අවසන් කර ඇති බව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එස්. වීරසිංහ යන අය මෙම පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ නොමැති බවත්, එම්.ඩී. විජේරත්න යන අය හෘදයාබාධයකින් වැල්ලවාය රෝහලේදී මියගිය පසු මියගිය අයගේ නීත්‍යානුකූල බිරිඳ ඇතුළු පාර්ශවය හා මියගිය අයගේ නීත්‍යානුකූල නොවන බිරිඳ වන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය අතර එම්.ඩී. විජේරත්න යන අයගේ මෘත ශරීරය සම්බන්ධයෙන් අයිතිය ඉල්ලා ආරාවුලක් පැනනැගීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට එම දෙපාර්ශවය පොලිස් ස්ථානයට පැමිණ සිටි අවස්ථාවේ දී ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි ඒ පිළිබඳව විමර්ශනය කිරීම පමණක් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

**<u>නිගමනය</u>**

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව පැමිණිලිකාරියට එරෙහිව සාධාරණ වූ පැමිණිල්ලක් ලැබී නොතිබියදී සහ එම පනතේ 109(5) වගන්තිය ප්‍රකාරය සිදුකරන ලද විමර්ශනයේදී හෝ පැමිණිලිකාරිය වරදක් සිදුකර ඇති බවට තහවුරු වී නොතිබියදී පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක කේ.එච්. සුමිත් පාලිත යන අය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එස්. වීරසිංහ යන අය පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සඳහා හෝ ඊට අදාළ විමර්ශන කටයුතු සඳහා සහභාගී වී නොමැති බවට අනාවරණය වී ඇති බැවින් ඔහු හට මෙම අත්අඩංගුවට ගැනීමට අදාළව කිසිදු වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **<u>මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා</u>** එදිරිව **<u>පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය</u>** **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකාරියට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් ලැබී නොතිබියදී ඇයව අත්අඩංගුවටගෙන ඇති බැවින් 3 වන වගඋත්තරකරු විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 3 වන වගඋත්තරකාර වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

01. 1 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක කේ.එච්. සුමිත් පාලිත යන අය විසින් රුපියල් පනස්දහස (රු.50,000/-)ක මුදලක් සහ 3 වන වගඋත්තරකාර වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී.එම්. කරුණාතිලක යන අය විසින් රුපියල් දසදහස (රු.10,000/-)ක මුදලක් වශයෙන් රුපියල් හැටදහස (රු.60,000/-)ක මුදලක් පැමිණිලිකාරිය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 1 වන සහ 3 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 09 . 30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකාරිය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.